FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

**2023 ජූලි**

3 වන වෙළුම - කලාප අංක 07


ප්‍රහසන ශිල්පිනී නතාෂාට ඇප


තරිඳු උඩුවරගෙදර අත්අඩංගුවට ගෙන පහරදෙයි



වතුකරයේ නාට්‍යවේදියකුට බුද්ධි අංශ බලපෑම්

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 18ක් 2023 ජූලි මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 09ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 07ක්, වෘත්තියවේදීත්වයට අදාළ එක් සිදුවීමක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ එක් සිදුවීමක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

01. රක්ෂිත බන්ධනාගාරගත කර සිටි ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරියට මහාධිකරණයෙන් ඇප නියම කිරීම.

02. කොළඹ මහාධිකරණයේ තීන්දුවක් බල රහිත කරන ලෙස ඉල්ලා, මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන අභියාචනාධිකරණයට පෙත්සමක් ගොනු කිරීම.

03. ජාතික හා ආගමික සංහිඳියාවට අගතියක් වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීමේ චෝදනාව මත රක්ෂිත බන්ධනාගාරගත කර සිටි රාජාංගනයේ සද්ධාතිස්ස හිමි ඇප මත මුදාහැරීම.

04. කුරුණෑගල මාධ්‍යවේදී පුෂ්පකුමාර ජයරත්න ලියු ප්‍රවෘතකට අදාළව පොලිස් පරීක්ෂණයක් ආරම්භ කිරීම.

05. ශ්‍රී ලාංකීය මාධ්‍යයේ සමාජභාවය ගැන පර්යේෂණ වාර්තාවක් එළිදැක්වීම සහ ඒ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීම.

06. විරෝධතාවක් වාර්තා කරමින් සිටියදී මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අත්අඩංගුවට ගැනීම සහ පහරදීම.

07. කොළඹ නම් කළ ස්ථාන කිහිපයක උද්ඝෝෂණයේ නිරත වීම තහනම් කරමින් ක්‍රියාකාරිකයින් 11 දෙනෙකුට එරෙහිව අධිකරණ නියෝගයක් නිකුත් කිරීම.

08. මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අත්අඩංගුවට ගැනීම හා ඔහුට පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම පරීක්ෂණයක් ආරම්භ කිරීම.

09. කළු ජූලියට 40 වසරක් පිරීම නිමිත්තෙන් පැවැත්වූ පෙළපාලියකට පොලිසිය කඳුළුගෑස් හා ජල ප්‍රහාර එල්ල කිරීම.

10. 83 කළු ජූලියේ වින්දිතයන් සිහිපත් කිරීම සඳහා පැවති වැඩසටහනකට සංවිධානාත්මක පිරිසක් හා පොලිසිය බාධා කිරීම.

11. වතුකරයේ නාට්‍ය දර්ශනයක් හමුදා හා පොලිස් බුද්ධි අංශ බලපෑම් මත අවලංගු කිරීම ගැන මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.

12. කාව්‍ය කෘතියක් රචනා කිරීම හේතුවෙන් දීර්ඝ කාලයක් අත්අඩංගුවේ පසු වූ අහ්නාෆ් ජසීම්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් තවදුරටත් ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයකු ලෙස නම් කිරීම.

13. අසාධාරණ ලෙස සේවයෙන් පහ කළ, මාධ්‍යවේදිනී කලාවර්ෂිනී කනගරත්නම් වෙත වන්දි ලබා දීමට අදාළ මාධ්‍ය සමාගම එකඟ වීම.

14. 2022 මැයි 9 ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පොලිසියට හා රජයට එරෙහිව ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම නිෂ්ප්‍රභ කිරීම.

15. තමන් ඝාතනය කිරීමේ උත්සාහයක් පිළිබඳව, අනුරාධපුර මාධ්‍යවේදී තම්සීර් හමීඩ් පොලිසියට පැමිණිලි කිරීම.

16. කුලියාපිටිය ප්‍රාදේශීය මාධ්‍යවේදී දිනේෂ් උපේන්ද්‍රට ඔහුගේ කාර්යාලය තුළදී පහරදීම.

17. කම්කරු අරගල මධ්‍යස්ථානය බොරැල්ලේදී පැවැත්වූ විරෝධතාවකට පොලිසිය පහරදීම හේතුවෙන් ක්‍රියාකාරිනියක තුවාල ලැබීම.

18. ජාතික ගීය 'විකෘති කරමින්' ගායනා කළේ යැයි ගායන ශිල්පිනී වන උමාරා සිංහවංශට එරෙහිව පරීක්ෂණ ආරම්භ කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 ජූලි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 09 |
| නීතිමය කොන්දේසි | 07 |
| වෘත්තියවේදීත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 01 |
| **එකතුව** | **18** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා රැසක් ජූලි මාසයේදී නිරීක්ෂණය විය. එයින් සිදුවීම් 09ක් මෙහි ඇතුළත් කර ඇති අතර, ඇතැම් සිදුවීම් නීතිමය ක්‍රියාමාර්ග හා සම්බන්ධ බැවින් එම සංරචකය යටතේ දක්වා ඇත.**

**2 වගුව: 2023 ජූලි: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 09**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| පහරදීම් | 02 |
| බාධා කිරීම්/නිදහස සීමා කිරීම් | 02 |
| මානසික හා වෙනත් බලපෑම් | 05 |
| **එකතුව** | **09** |

01. **කුරුණෑගල මාධ්‍යවේදී පුෂ්පකුමාර ජයරත්න ලියූ පුවතකට අදාළව පොලිස් පරීක්ෂණයක් ආරම්භ කිරීම.**

නීති විරෝධීව එකලස් කරන ලදැයි සැක පිට, වාරියපොළ පොලිසිය මගින් වාහනයක් අත්අඩංගුවට ගැනීම පිළිබඳව පළ කළ පුවතක් සම්බන්ධයෙන්, එම වාහනයේ හිමිකරු වන ව්‍යාපාරිකයකු විසින් කරන ලද පැමිණිල්ලකට අදාළව මෙම පරීක්ෂණය ආරම්භ කර තිබේ. තම වාර්තාකරණය පැහැදිලි මූලාශ්‍ර සහිතව සිදු කළ බවත්, සැකකරුගේ පැමිණිල්ලකට අනුව මෙබඳු පරීක්ෂණයක් පැවැත්වීම අනිසි බලපෑමක් බවත් මාධ්‍යවේදියා ප්‍රකාශ කරයි.

මූලාශ්‍ර: youtube.com

02. **කළු ජූලියට 40 වසරක් පිරීම නිමිත්තෙන් පැවැත්වූ පෙළපාලියකට පොලිසිය කඳුළුගෑස් හා ජල ප්‍රහාර එල්ල කිරීම.**

83 කළු ජූලියේ 40 වැනි සැමරුම වෙනුවෙන් ජූලි 23 වැනිදා සමාජවාදී තරුණ සංගමය සංවිධානය කළ පාගමනක් කොළඹ පුරහල අසලදී කඳුළු ගෑස් හා ජල ප්‍රහාර එල්ල කොට විසුරුවාහැරීමට පොලිසිය ක්‍රියා කළේය. පාගමන කොළඹ හයිඩ් පිටියේ සිට විහාරමහා දේවී උද්‍යානය දක්වා ගමන් කිරීමට සැලසුම් කර තිබිණි. පොලිසිය නිවේදනය කළේ, පොලිස් ආඥා පනතේ 78(2) වගන්තිය යටතේ පෙළපාලියක් යෑමට පැය 6කට පෙර දැනුම් දී නොමැති බැවින් එය විසුරුවාහරින බවයි.

මූලාශ්‍රය: www.bbc.com

03. **83 කළු ජූලියේ වින්දිතයන් සිහිපත් කිරීම සඳහා පැවති වැඩසටහනකට සංවිධානාත්මක පිරිසක් හා පොලිසිය බාධා කිරීම.**

'උතුරු - දකුණු සහෝදරත්වය' නමින් සංවිධානය වූ සිවිල් හා දේශපාලන ක්‍රියාකාරිකයින් පිරිසක් විසින් ජූලි 23 වැනිදා බොරැල්ල කනත්ත ඉදිරිපිටදී පවත්වන ලද මෙම සමරු වැඩසටහනට සංවිධානාත්මක කණ්ඩායමක් පැමිණ බාධා කළ අතර, පොලිසිය එම කලහකාරී පිරිස ඉවත් කරනු වෙනුවට සමරු වැඩසටහනට එක් වූ පිරිස විසුරුවා හැරීමට උත්සාහ කළේය.

මූලාශ්‍රය: www.youtube.com

04. **වතුකරයේ නාට්‍ය දර්ශනයක් හමුදා හා පොලිස් බුද්ධි අංශ බලපෑම් මත අවලංගු කිරීම ගැන මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.**

ජූලි මස 09 වැනිදා සවස බොගවන්තලාව, කොටියාගල ප්‍රදේශයේ රඟ දැක්වීමට නියමිතව තිබූ 'ලයත්තු කෝළිගල්' නාට්‍යය යුද හමුදාව හා පොලිස් STF බලකාය වතු පාලනාධිකාරිය සමග එක්වී වළක්වාලීම සම්බන්ධයෙන් එම නාට්‍යයේ අධ්‍යක්ෂවරයා වන රාසයියා ලෝගනාදන් ජූලි 26 වැනිදා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කළේය. ජනමාධ්‍ය හමුවේ ඔහු ප්‍රකාශ කළේ, වතුකරය ආශ්‍රිත සංස්කෘතික ක්‍රියාකාරකම්, ආරක්ෂක අංශවල දැඩි අධීක්ෂණයට ලක්ව තිබෙන බවයි.

මූලාශ්‍රය: theleader.lk

05. **කාව්‍ය කෘතියක් රචනා කිරීම හේතුවෙන් දීර්ඝ කාලයක් අත්අඩංගුවේ පසු වූ අහ්නාෆ් ජසීම්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් තවදුරටත් ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයකු ලෙස නම් කිරීම.**

2023 ජූනි මස 8වැනිදා ආරක්ෂක අමාතාංශයේ ලේකම් කමල් ගුණරත්න විසින් නිකුත් කරන ලද අංක 2335/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයන් 301 ක් හා සංවිධාන 15 ක් නම් කර ඇති අතර, අහ්නාෆ් ජසීම්ගේ නමද එහි ඇතුළත් වේ.

අහ්නාෆ්ගේ නීතිඥ සංජය විල්සන් ජයසේකර ට්විටර් පණිවිඩයකින් පෙන්වා දෙන්නේ, ඔහු අත්අඩංගුවට ගැනීම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් බවට UNWGAD විසින් ප්‍රකාශ කර ඇති අතර, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ මෙම පියවර නිසා, අහ්නාෆ් ජසීම්ට රැකියාවක් පවා සොයා ගත නොහැකිව මේ වන විට ගොවිතැන් කිරීමට සිදුව ඇති බවයි. 2020 මැයි 16 වැනිදා අත්අඩංගුවට ගැනුණු ඔහු දින 579ක් රඳවා තැබීමෙන් පසු, අධිකරණය මගින් ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: theleader.lk

06. **තමන් ඝාතනය කිරීමේ උත්සාහයක් පිළිබඳව, අනුරාධපුර මාධ්‍යවේදී තම්සීර් හමීඩ් පොලිසියට පැමිණිලි කිරීම.**

අනුරාධපුර පොසොන් උත්සව සමයේ ව්‍යාපාරික ස්ථාන බදු දීමේ අක්‍රමිකතා පිළිබඳ පුවතක් වාර්තා නොකරන ලෙස පිරිසක් තමන්ට තර්ජනය කළ බවත්, එම තර්ජනය නොතකා එම පුවත වාර්තා කිරීම නිසා ඉන් එක් පුද්ගලයකු ජූලි 21 වැනිදා අනුරාධපුර රෝහල අසලදී තමන්ට පිහියෙන් ඇනීමට තැත් කළ බවත් මාධ්‍යවේදියා කියා සිටී. ඔහු ඉවතට පැන අනතුරින් ගැලවුණු නමුත් පසු අවස්ථාවකදී ඝාතනය කරන බවට අදාළ පුද්ගලයා තර්ජනය කර තිබේ. අදාළ සැකකරු පිළිබඳවද පැමිණිල්ලේ සඳහන් කර තිබේ. උතුරු මැද පළාත භාර නි. පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි සිදුවීම පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

මූලාශ්‍රය: si.rata.lk

07. **කුලියාපිටිය ප්‍රාදේශීය මාධ්‍යවේදී දිනේෂ් උපේන්ද්‍රට ඔහුගේ කාර්යාලය තුළදී පහරදීම.**

කුලියාපිටිය නගරයේ වෙළෙඳ සංකීර්ණයක උඩු මහලේ පිහිටි සිය කාර්යාලයේ දොරගුළු කඩා දැමීමේ සිද්ධියක් සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයක් සිදු කෙරෙන අවස්ථාවේ එයට අනවසරයෙන් ඇතුළු වී කාර්යාලය වීඩියෝගත කළ පුද්ගලයකුගෙන් ප්‍රශ්න කිරීමේදී මෙම ප්‍රහාරය එල්ල කර ඇත. මේ හේතුවෙන් මාධ්‍යවේදියා කුලියාපිටිය ශික්ෂණ රෝහලෙන් නේවාසිකව ප්‍රතිකාර ලැබීය. අදාළ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත.

මූලාශ්‍රය: lankadeepa.lk

08. **කම්කරු අරගල මධ්‍යස්ථානය බොරැල්ලේදී පැවැත්වූ විරෝධතාවකට පොලිසිය පහරදීම හේතුවෙන් ක්‍රියාකාරිනියක තුවාල ලැබීම.**

ජූලි 28 වැනිදා බොරැල්ලේදී පැවති මෙම විරෝධතාව විසුරුවාහැරීමට පොලිසිය ප්‍රහාර එල්ල කර ඇති අතර, රශ්මි දිව්‍යාජලී නැමති ක්‍රියාකාරිනියගේ හිසට තුවාල සිදුවීම නිසා ඇය රෝහල්ගත කෙරිණි. උද්ඝෝෂකයින් චෝදනා කරන්නේ පොලිසිය දෙසින් එල්ල වූ ගල් ප්‍රහාරයකින් ඇය තුවාල ලැබූ බවයි. යෝජිත කම්කරු නීති හා කම්කරු අරමුදල් කොල්ලයට එරෙහිව කොළඹ ලිප්ටන් වටරවුම අසල පැවැත්වීමට නියමිතව තිබූ මෙම විරෝධතාව, පොලිසිය හා ආරක්ෂක හමුදා යොදවා වැළැක්වීම හේතුවෙන් එය බොරැල්ල සහස්පුර නිවාස සංකීර්ණය ආසන්නයේ පැවැත්වෙද්දී මෙම ප්‍රහාරය එල්ල විය.

මූලාශ්‍රය: english.theleader.lk

09. **ජාතික ගීය 'විකෘති කරමින්' ගායනා කළේ යැයි ගායන ශිල්පිනී වන උමාරා සිංහවංශට එරෙහිව පරීක්ෂණ ආරම්භ කිරීම.**

ජූලි 30දා පැවති ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරඟාවලියේ සමාරම්භක උත්සවයේදී ජාතික ගීය විකෘති කොට ගායනා කරන ලදැයි විවිධ පාර්ශ්වවලින් ඇයට එරෙහිව චෝදනා එල්ල වූ අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් වූ පැමිණිලි කිහිපයක් මත පරීක්ෂණයක් ආරම්භ කෙරිණි. එමෙන්ම අගමැතිවරයාගේ නියමයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ පිළිබඳ විමර්ශනය කිරීමට කමිටුවක් පත් කෙරිණි. තමන් කිසිසේත්ම ජාතික ගීය විකෘති කිරීමක් නොකළ බව උමාරා සිංහවංශ ෆේස්බුක් සටහනක් තබමින් ප්‍රකාශ කළාය.

මූලාශ්‍ර: www.wsws.org, www.lankadeepa.lk

---

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 07 ක් ජූලි මාසය තුළ නිරීක්ෂණය විය. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට සම්බන්ධ අධිකරණ ක්‍රියාමාර්ග හා පෙර සිදුවීම්වල වර්ධනයන් ඊට ඇතුළත් වෙයි. ICCPR පනත යටතේ අත්අඩංගුවේ පසුවූ ප්‍රහසන ශිල්පිනී නතාෂා එදිරිසූරියට ඇප නියම කරමින් මහාධිකරණය ලබා දුන් නියෝගය, එම පනත අවභාවිතය පිළිබඳ පුළුල් ලෙස සාකච්ඡා කෙරෙන වැදගත් නඩු තීන්දුවක් ලෙස සැලකිය හැකිය. එමෙන්ම මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අත්අඩංගුවට ගෙන පහරදීම සහ අධිකරණය හමුවේ ඔහුට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට පොලිසිය අසමත් වීමද, අදාළ සිදුවීමේදී මාධ්‍යවේදියාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අධිකරණයේ හා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාධනීය මැදිහත්වීමද විශේෂයෙන් නිරීක්ෂණය විය.**

**3 වගුව: 2023 ජූලි: නීතිමය කොන්දේසි - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 07 |
| **එකතුව** | **07** |

01. **රක්ෂිත බන්ධනාගාරගත කර සිටි ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරියට මහාධිකරණයෙන් ඇප නියම කිරීම.**

ප්‍රහසනාත්මක ඉදිරිපත් කිරීමකින් බුද්ධාගමට අපහාසයක් සිදු කළේයැයි ICCPR පනත යටතේ රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි නතාෂා එදිරිසූරිය වෙනුවෙන් ඉදිරිපත් කළ ඇප අයදුම්පතක් සලකා බැලූ මහාධිකරණය, ඇය ඇප මත මුදාහැරීමට ජූලි 5 වැනිදා නියෝග කළේය. අදාළ ප්‍රකාශය ආගමික හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීමක් සිදු කරන ප්‍රකාශ ලෙස ගත නොහැකි බව පෙන්වා දුන් විනිසුරුවරයා, ICCPR පනත එය හඳුන්වා දුන් අරමුණුවලින් බැහැරව වර්තමානයෙහි ක්‍රියාත්මක වන බවද ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: sinhala.newsfirst.lk

02. **කොළඹ මහාධිකරණයේ තීන්දුවක් බල රහිත කරන ලෙස ඉල්ලා, මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන අභියාචනාධිකරණයට පෙත්සමක් ගොනු කිරීම.**

කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් නියෝගයක් බල රහිත කරන ලෙස ඉල්ලා ගොනු කළ ප්‍රතිශෝධන අයදුම්පතක් ප්‍රතික්ෂේප කරමින් මහාධිකරණය ලබා දුන් නියෝගයක් බල රහිත කරන ලෙස ඉල්ලා මෙම අභියාචනය ගොනු කොට තිබේ.

ප්‍රහසන ශිල්පිනී නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ප්‍රවෘත්ති සාකච්ඡාවකදී අදහස් පළ කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන ඇතුළු පිරිසකට එරෙහිව පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කර තිබූ අතර, එය බල රහිත කරන ලෙස මහාධිකරණයට යොමු කළ ප්‍රතිශෝධන පෙත්සම නොතීසි නොයවාම ප්‍රතික්ෂේප කිරීමට ජූලි 06 වැනිදා නියෝග කෙරිණි.

මූලාශ්‍රය: thetime.lk

03. **2022 මැයි 9 ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පොලිසියට හා රජයට එරෙහිව ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම නිෂ්ප්‍රභ කිරීම.**

2022 මැයි 9 දින ගෝල්ෆේස්හි ජනාධිපති ලේකම් කාර්යාලය අසල හා අගමැති නිල නිවස අසලදී උද්ඝෝෂකයින්ට පහරදීම හා ඉන් අනතුරුව රට පුරා සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට කටයුතු නොකිරීම සම්බන්ධව රයිට් ටු ලයිෆ් සංවිධානය වෙනුවෙන් එහි විධායක අධ්‍යක්ෂ පිලිප් දිසානායක විසින් නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු වගකිවයුතු පොලිස් ප්‍රධානීන්ට, මහජන ආරක්ෂක අමාත්‍යවරයාට හා නීතිපතිවරයාට එරෙහිව මෙම පෙත්සම ගොනු කර තිබිණි. SC/FRA/15/23 අංක දරන මෙම නඩුකරය ව්‍යවස්ථාපිත කාල රාමුව පසු වී ගොනු කරන ලද්දක් බවට නීතිපතිවරයා විසින් ඉදිරිපත් කළ මූලික විරෝධතාව පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය, එය විභාගයට නොගෙනම නිෂ්ප්‍රභ කළේය.

මූලාශ්‍රය: www.aithiya.lk

04. **ජාතික හා ආගමික සංහිඳියාවට අගතියක් වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීමේ චෝදනාව මත රක්ෂිත බන්ධනාගාරගත කර සිටි රාජාංගණයේ සද්ධාතිස්ස හිමි ඇප මත මුදාහැරීම.**

ඉහත චෝදනා මත සද්ධාතිස්ස හිමි මැයි 28 වැනිදා අත්අඩංගුවට ගැනුණු අතර අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජූලි 05 වැනිදා දක්වාද, නැවත ජූලි 12 වැනිදා දක්වාද රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි. ජූලි 12 වැනිදා නඩුව යළි කැඳවූ අවස්ථාවේදී, සැකකාර හිමි නම රු. ලක්ෂ 5 බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදාහැරීමට කොටුව මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. හිමිනමට එරෙහිව ICCPR පනත, පරිගණක අපරාධ පනත හා දණ්ඩ නීති සංග්‍රහය යටතේ චෝදනා ගොනු කර තිබූ අතර ඇප නියම කරමින් මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශ කළේ අදාළ චෝදනා ICCPR පනත යටතට නොගැනෙන බවයි.

මූලාශ්‍රය: divaina.lk

05. **විරොධතාවක් වාර්තා කරමින් සිටියදී මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අත්අඩංගුවට ගැනීම සහ පහරදීම.**

ජූලි 28 වැනිදා කොළඹදී පැවති විරෝධතාවක් වාර්තාකරමින් සිටියදී පොලිසිය විසින් ඔහු අත්අඩංගුවට ගැනිණි, එහිදී මාධ්‍යවේදියා හිංසනයට සහ අවමන්සහගත සැලකීමට ලක් කෙරෙන දර්ශන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ අතර, පොලිස් ජීප් රථයෙන් බොරැල්ල පොලිසිය වෙත රැගෙන යන අතරතුර තමන්ට දැඩි ලෙස පහරදුන් බව මාධ්‍යවේදියා අධිකරණය හමුවේ ප්‍රකාශ කර තිබේ. ජූලි 29 වැනිදා ඔහු ජාතික රෝහලට ඇතුළත් කෙරුණු අතර එහිදී ඔහු පරීක්ෂා කළ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා, ඔහුට ඇප නියම කළේය. මෙම අත්අඩංගුවට ගැනීම, ජනමාධ්‍ය සංවිධාන ඇතුළු පාර්ශ්ව රැසක් විසින් දැඩි ලෙස හෙළාදකින ලදි. අදාළ නඩුව අගෝස්තු 31 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: www.bbc.com

06. **කොළඹ නම් කළ ස්ථාන කිහිපයක උද්ඝෝෂණයේ නිරත වීම තහනම් කරමින් ක්‍රියාකාරිකයින් 11 දෙනෙකුට එරෙහිව අධිකරණ නියෝගයක් නිකුත් කිරීම.**

ජූලි 28 වැනිදා ලිප්ටන් වටරවුම අසල පැවැත්වීමට සංවිධානය කර තිබූ උද්ඝෝෂණයකට අදාළව, මරදාන පොලිසියේ ස්ථානාධිපතිවරයාගේ ඉල්ලීම මත කම්කරු අරගල සංවිධානයේ ලේකම් දුමින්ද නාගමුව ඇතුළු ක්‍රියාකාරිකයින් පිරිසකට එරෙහිව මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය විසින් මෙම තහනම් නියෝගය නිකුත් කර තිබිණි.

මූලාශ්‍රය: www.bbc.com

07. **මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අත්අඩංගුවට ගැනීම හා ඔහුට පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම පරීක්ෂණයක් ආරම්භ කිරීම.**

මාධ්‍යවේදියා අත්අඩංගුවට ගැනීමේ සිදුවීමට අදාළ සියලු පාර්ශ්වවලින් තොරතුරු කැඳවා ඇති අතර, විමර්ශනය සඳහා අදාළ පිරිස් කැඳවීමට නියමිත බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම නිවේදනය කළේය. ජූලි 28 වැනිදා ඔහු පොලිස් අත්අඩංගුවේ සිටියදී කොමිසමේ ක්ෂණික ප්‍රතිචාර කණ්ඩායමේ නිලධාරීන් එහි ගොස් පහරකෑමට ලක්ව සිටි මාධ්‍යවේදියා අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත කරන ලෙස උපදෙස් දී ඇතත්, පසුදා උදේ වන තුරු පොලිසිය එම උපදෙස් ක්‍රියාත්මක කර නොතිබිණි.

මූලාශ්‍රය: www.hrcsl.lk

## වෘත්තියවේදීත්වය

**වෘත්තියවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධීනත්වය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිග ැනීම යන දර්ශක ඇතුළත් වේ. මෙම සංරචකය යටතට ගැනෙන එක් සිදුවීමක් ජූලි මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2023 ජූලි: වෘත්තියවේදීත්වය - සිදුවීම් 01**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි | 01 |
| **එකතුව** | **01** |

01. **අසාධාරණ ලෙස සේවයෙන් පහ කළ, මාධ්‍යවේදිනී කලාවර්ෂිනී කනගරත්නම් වෙත වන්දි ලබා දීමට අදාළ මාධ්‍ය සමාගම එකඟ වීම.**

    2019 වසරේදී තමන් අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් Athavan Media හි ප්‍රවෘත්ති කළමනාකාරිනිය ලෙස සේවය කළ මාධ්‍යවේදිනී කලාවර්ෂිනී කනගරත්නම් විසින් Lyca Mobile සමාගමට එරෙහිව කොළඹ කම්කරු විනිශ්චය සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කර තිබූ අතර රු. මිලියනයක වන්දියක් ලබා දී පැමිණිල්ල සමථයකට පත් කර ගැනීමට අදාළ සමාගම එකඟ වී තිබේ. ඒ අනුව, ජූලි 18 වැනිදා අදාළ වන්දි මුදල ප්‍රදානය කෙරිණි.

    මූලාශ්‍රය: si.rata.lk

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. මේ අතුරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන එක් සිදුවීමක් මෙහි ඇතුළත් වේ.**

**5 වගුව: 2023 ජූලි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 01**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 01 |
| **එකතුව** | **01** |

01. **ශ්‍රී ලාංකීය මාධ්‍යයේ සමාජභාවය ගැන පර්යේෂණ වාර්තාවක් එළිදැක්වීම සහ ඒ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීම.**

    ජාත්‍යන්තර පර්යේෂණ සහ හුවමාරු මණ්ඩලය (IREX) විසින් හෑෂ්ටැග් පරපුරපරපුර සමඟ එක්ව සිදු කළ, Behind the scenes(A look into the gendered dimensions of Sri Lankan media (ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවල ස්ත්‍රී-පුරුෂ සහ අනෙකුත් සමාජභාවය පිළිබඳ සොයා බැලීමක්) නැමති මෙම පර්යේෂණයට ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන 12ක් පදනම් කර ගැනිණි. ජූලි 26 වැනිදා මෙම වාර්තාව එළිදැක්වීම හා ඒ පිළිබඳව පැවත්වූ මාර්ගගත සංවාදයට IREX ආයතනයේ ස්ත්‍රී-පුරුෂ හා අනෙකුත් සමාජභාව පිළිබඳ උපදේශකවරුන් වන ධාරිනී ප්‍රිසිලා, හරිනි ප්‍රනාන්දු සහ එක්ස්ප්‍රස් නිව්ස්පේපර්ස් ආයතනයේ ඩිජිටල් මාධ්‍ය ප්‍රධානී රමේෂ් කුමාර් සහභාගී වූහ.

    මූලාශ්‍රය: MFRM Desk

**6 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි-ජූලි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2023 ජනවාරි - ජූනි | | 2023 ජූලි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 18 | - | 09 |
| නීතිමය කොන්දේසි | 45 | 13 | 07 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | 04 | - | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 21 | - | 01 |
| **එකතුව** | **88** | **13** | **18** |

[පසුගිය මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න]

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රුස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Hana Ibrahim +94 77 741 2995 | Secretary: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620
Treasurer: Thaha Muzammil +94 77 3741026 | Assistant Secretary: Priyadarshani Sivaraja +94 772530258
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25


Layout: Nalinda Seneviratne